සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved



Learning Resource Centre
De Mazenod College
Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01

නම / பெயர் / Name ..................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ...............................

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කව තුළ (×) ලකුණ යොදන්න.

---

01. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව ලියැවී ඇති සාහිත්‍ය මූලාශ්‍රයක් ලෙස සැලකෙන්නේ මින් කුමක් ද?
(1) දීපවංසය (2) මහාවංසය (3) වංසත්ථප්පකාසිනී (4) නිකාය සංග්‍රහය

02. ඇඹ කණුවල ලියූ අභිලේඛන සඳහා ප්‍රසිද්ධියක් උසුලන ස්ථානයක් වන්නේ,
(1) ඇම්බැක්කේ දේවාලය යි. (2) සීගිරිය යි.
(3) ඉසුරුමුණි විහාරය යි. (4) මහනුවර දළඳා මාලිගය යි.

03. • කැලෑදෙල් පුළුස්සා ආහාරයට ගැනීම.
• ලුණු ආහාරයට ගැනීම.
ප්‍රාග් ඓතිහාසික මානවයින් පිළිබඳ ඉහත සඳහන් සාක්ෂි හමුවූයේ කුමන ස්ථානයකින් ද?
(1) කුරුවිට බටදොඹලෙන (2) පාහියන්ගල ලෙන (3) කිතුල්ගල බෙලිලෙන (4) රාවණාඇල්ල ලෙන

04. මුල් ඓතිහාසික යුගයේ දී ජනාවාස ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශවල ව්‍යාප්ත වීමට බලපෑ ප්‍රධාන සාධකය වන්නේ,
(1) ජලය ප්‍රමාණවත් තරම් ලැබීම යි. (2) පසේ පැවති සාරවත් බව යි.
(3) තැනිතලා භූමි ප්‍රදේශයක් වීම යි. (4) ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය යි.

05. දෙමව්පියන් විසින් තමන්ගේ දියණිය සූප ශාස්ත්‍රයෙහි නිපුණ කරවනු ලැබීම ඔවුන් සතු වගකීමක් බව සඳහන් වන සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,
(1) සහස්සවත්ථුප්පකරණය යි. (2) රසවාහිනිය යි.
(3) සද්ධර්මාලංකාරය යි. (4) සමන්තපාසාදිකාව යි.

06. විමධ්‍යගතව තිබූ දේශපාලන බලය මධ්‍යගත කිරීමේ දී පරුමකවරුන්ගේ සහාය ලබාගත් රජතුමා කවුරුන් ද?
(1) පණ්ඩුකාභය (2) දේවානම්පියතිස්ස (3) දුටුගැමුණු (4) වසභ

07. වල්ලිපුරම් රන්පත් ලේඛනය මගින් හෙළිවන වැදගත් තොරතුරක් වන්නේ,
(1) තමාට උපකාර කළ අයට ප්‍රති උපකාර කිරීමේ යහපත් ගුණාංගය පිළිබඳව යි.
(2) ඥාති සබඳතා හරහා දේශපාලන බලය ස්ථාවරව පවත්වා ගැනීමේ වැදගත්කම යි.
(3) ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන මණ්ඩල පැවති බව යි.
(4) පළාත් පාලනය සඳහා රජයට සම්බන්ධ වෙනම පරිපාලන ඒකක පැවති බව යි.

08. ශ්‍රී ලංකාව රතුකැට දිවයින නමින් හැඳින් වූ අරාබි ජාතිකයා කවුරුන් ද?
(1) ඉබන්බතුතා (2) සුලෙයිමාන් (3) ටොලමි (4) අල්බලසූරි



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

09. අතීතයේ පැවති වෙළෙඳාම පිළිබඳ සෙල්ලිපියක "අබල වපර" ලෙස සඳහන් වී ඇති වෙළෙඳාම කුමක් ද?

(1) දිවුල් වෙළෙඳාම යි. (2) සියඹලා වෙළෙඳාම යි.

(3) සුවඳ විලවුන් වෙළෙඳාම යි. (4) අබ වෙළෙඳාම යි.

10. මහ වැව්වල දක්නට ලැබෙන විවිධ තාක්ෂණික අංග I තීරුවේ ද, ඒවායින් ඉටුවන කාර්යයන් කිහිපයක් II තීරුවේ ද, දැක්වේ. I තීරුවේ අනුපිළිවෙලට II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. රළපනාව<br>2. බිසෝකොටුව<br>3. සොරොව්ව | A - ජලයේ පීඩනය පාලනය කිරීම.<br>B - වාරි ඇළට ජලය මුදා හැරීම.<br>C - වැව් බැම්ම ඛාදනයෙන් වළක්වා ගැනීම.<br>D - අතිරික්ත ජලය පිට කිරීම. |

(1) CAB (2) CBD (3) ABC (4) ADC

11. වෙළෙඳ කටයුතුවලදී ව්‍යාජ බර කිරුම් සිදු කිරීම නීති විරෝධී කටයුත්තක් ලෙස සඳහන් කර ඇති සෙල්ලිපිය මින් කුමක් ද?

(1) වේවැල්කැටිය සෙල්ලිපිය (2) ගොඩවාය සෙල්ලිපිය

(3) මිහින්තලා පුවරු ලිපිය (4) සොරබොරවැව ටැම් ලිපිය

12. පහත සඳහන් සේවා අතුරින් වසභ රජතුමා සිදුකළ සේවාවක් නොවන්නේ කුමක් ද?

(1) මහ වැව් ඉදිකිරීම ආරම්භ කිරීම. (2) උමං ජල මාර්ග ඉදිකිරීම.

(3) රෝහල් දහ අටක් ඉදි කිරීම. (4) ඇළහැර ඇළ ඉදිකිරීම.

13. පැරණි සමාජ ධූරාවලියේ දී කුඩීන් නමින් හඳුන්වන පිරිසට අයත් වෘත්තීය කණ්ඩායමක් වන්නේ,

(1) ගුරුවරු ය. (2) ගොවියන් ය. (3) වෛද්‍යවරුන් ය. (4) දාසයන් ය.

14. අතීතයේ ඇළ මාර්ගවල මත්ස්‍යයින් ඇල්ලීම වෙනුවෙන් අයකළ බදු වර්ගය හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?

(1) මතරමපිඩක (2) දකපති (3) බොජකපති (4) කෙටුකනබඅය

15. තිරිත්දිග ප්‍රදේශවල බිහිවූ රාජධානි කිහිපයක් I තීරුවේ ද, එම රාජධානිවල පාලකයින් II තීරුවේ ද දැක්වේ. I තීරුවේ අනුපිළිවෙළට II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. දඹදෙණිය<br>2. කුරුණෑගල<br>3. කෝට්ටේ | A - හතරවන පරාක්‍රමබාහු<br>B - තුන්වන පරාක්‍රමබාහු<br>C - දෙවන පරාක්‍රමබාහු<br>D - හයවන පරාක්‍රමබාහු |

(1) ABD (2) CBA (3) CAD (4) BAC

16. පහත ABC හා D යටතේ දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතුරෙන් වීර අලකේශ්වර සිරකරුවෙකු ලෙස චීනයට රැගෙන ගිය අවධියේ ජීවත්වූවෙකුට දැන ගැනීමට නොලැබෙන සිදුවීම් ඇතුළත් පිළිතුර තෝරන්න.

A - සිංහල සංගෙ නමින් කැරැල්ලක් ඇතිවීම. B - කාලිංග මාඝ ආක්‍රමණය

C - පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන ඉදිකිරීම. D - පාණ්ඩ්‍ය හමුදාවක් පැමිණ දළදාව පැහැරගෙන යාම.

(1) A සහ B ය. (2) B සහ C ය. (3) C සහ D ය. (4) A සහ C ය.

17. උඩරට රාජධානියේ පැවති බද්දෙ සංවිධාන ව්‍යුහය තුළ ඇතුන් ඇල්ලීමේ කාර්යය සඳහා අයකළ බද්ද හැඳින්වූයේ කුමන නමකින් ද?

(1) මඩිගෙ බද්ද (2) කුරුවෙ බද්ද (3) හැඳ බද්ද (4) රදා බද්ද

18. මහනුවර රාජධානිය තුළ තම බලය තහවුරු කර ගැනීම සඳහා පෘතුගීසීන් අනුගමනය කළ උපාය මාර්ගය වූයේ,

(1) උඩරට රදළ ප්‍රධානීන්ගේ සහාය ලබා ගැනීම ය.

(2) මහනුවර රාජධානිය තුළ කතෝලික ආගම ප්‍රචාරය කිරීම ය.

(3) කොනප්පු බණ්ඩාරට රජකම ලබාදීමට කටයුතු කිරීම ය.

(4) කුසුමාසන දේවිය තම රැකවරණය යටතේ උඩරට රජ කරවීම ය.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

19. යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීමට නව මුහුදු මාර්ග සෙවීම සඳහා උනන්දු වීම කෙරෙහි බලපෑ ප්‍රධානම හේතුව මින් කුමක් ද?
(1) ජාතික රාජ්‍යවල පාලකයින් නව මුහුදු මාර්ග සෙවීමට අනුග්‍රහය දැක්වීම.
(2) ක්‍රිස්තු ධර්මය ප්‍රචාරය කිරීම හා ජාත්‍යන්තර කීර්තිය දිනා ගැනීම.
(3) කොන්ස්තන්තිනෝපලය අහිමි වීම හා පෙර අපර දෙදිග වෙළෙඳාමට බාධා ඇතිවීම.
(4) නාවික ගමන්වල සුරක්ෂිතව යෙදීමට උපකාරී වූ මාලිමා යන්ත්‍රය නිපදවීම.

20. ක්‍රි.ව. 1638 සහ 1766 ගිවිසුම් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ලන්දේසීන් සමග උඩරට රජවරු අත්සන් කළ ගිවිසුම් ය.
(2) නායක්කර් රජවරු හා උඩරට රදළ ප්‍රධානීන් අතර අත්සන් කළ ගිවිසුම් ය.
(3) ඉංග්‍රීසීන් සහ උඩරට රජවරු අතර අත්සන් කළ ගිවිසුම් ය.
(4) පෘතුගීසීන් සමග උඩරට රජවරු අත්සන් කළ ගිවිසුම් ය.

21. A - හෙන්රිබෙල් B - හෙන්රිකෝට්
C - සැමුවෙල් ක්‍රොම්ප්ටන් D - ජෝර්ජ් ස්ටීවන්සන්

ඉහත සඳහන් පුද්ගලයින් අතුරෙන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සොයා ගැනීම් සිදු කරන ලද අය දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) A සහ D ය. (2) A සහ B ය. (3) B සහ C ය. (4) B සහ D ය.

22. මැකඩම් ක්‍රමය සොයා ගැනීම නිසා පහසු වූ කාර්යය මින් කුමක් ද?
(1) වාත්තු කළ යකඩ නිපදවීම. (2) දුම්රිය මාර්ග තැනීම.
(3) මහාමාර්ග තැනීම (4) සියුම් හා ශක්තිමත් නූල් සැකසීම.

23. ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමු වීමට හේතු වූ ප්‍රධානම සාධකය වූයේ,
(1) ප්‍රංශවරු ලංකාව අත්පත් කර ගැනීම පිළිබඳ ඇති වූ සැකය.
(2) ලන්දේසීන් සතුව පැවති වෙළෙඳබලය අයිතිකර ගැනීම.
(3) වතු වගාවට සුදුසු ඉඩම් ලබා ගැනීමේ අවශ්‍යතාවය.
(4) ශ්‍රී ලංකාවේ පිහිටීම හා වැදගත්කම.

24. 1818 නිදහස් අරගලය සම්බන්ධ නිවැරදි තොරතුර ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ටොරින්ටන් ආණ්ඩුකාරවරයා ආපසු බ්‍රිතාන්‍යයට කැඳවීම.
(2) හජ්ජි මරික්කාර් වෙල්ලස්සේ මුහන්දිරම් තනතුරට පත් කිරීම.
(3) ගොන්ගාලේගොඩ බණ්ඩා රජු ලෙස ප්‍රකාශයට පත් කිරීම.
(4) නිල්පොත නම් සංඛ්‍යා ලේඛන සංග්‍රහය සඳහා තොරතුරු සෙවීම.

25. ග්‍රාමීය සුබසාධනයට පුරෝගාමී මෙහෙයක් ඉටුකළ "ගම් සභාව" අක්‍රීයවීම සිදුවූයේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ද?
(1) ඩොනමෝර් (2) කෝල්බෘක් (3) කෲව් මැකලම් (4) මැනිං

26. නවකතාවල විවිධ චරිත සංවාදයට ලක් කිරීමෙන් මධ්‍යසාර භාවිතයේ අහිසි විපාක පැහැදිලි කළ පුද්ගලයා වූයේ,
(1) වලිසිංහ හරිස්චන්ද්‍රතුමා ය. (2) අනගාරික ධර්මපාලතුමා ය.
(3) ජෝන් ද සිල්වා මහතා ය. (4) පියදාස සිරිසේන මහතා ය.

27. මිෂනාරිවරු ලංකාවේ තම ආගම පැතිරවීමේ දී කොළඹ මධ්‍යස්ථානය කොට ගෙන ක්‍රියාත්මක වූ මිෂනාරි සංවිධානය කුමක් ද?
(1) බැප්ටිස්ට් මිෂනාරි සංවිධානය. (2) ඇමරිකන් මිෂනාරි සංවිධානය.
(3) වෙස්ලියන් මිෂනාරි සංවිධානය. (4) ලන්ඩන් මිෂනාරි සංවිධානය.

28. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මෙරට සිදු වූ වෙනස්කම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
A - කුරුඳු වගාව ආරම්භය B - මහාමාර්ග හා දුම්රිය මාර්ග ආරම්භ කිරීම.
C - රාජකාරි ක්‍රමය අහෝසි කිරීම. D - ලංකාව ශ්‍රී ලංකාව යන නාමයෙන් හැඳින්වීම.
E - ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම.
(1) ACD ය. (2) BCD ය. (3) BDE ය. (4) BCE ය.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

29. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය නිසා හටගත් පහත දැක්වෙන වෙනස්කම් අතුරින් සංස්කෘතික වෙනස්කම් දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A - සමාජශාලා හා නිවාඩු නිකේතන බිහිවීම.

B - කම්කරු පන්තියක් බිහිවීම.

C - වෘත්තීය සංගම් බිහිවීම.

D - බටහිර ආහාරපානවලට හුරුවීම.

(1) A සහ C ය. (2) B සහ C ය. (3) A සහ D ය. (4) C සහ D ය.

30. ඡන්ද පෙත්සම් පිළිබඳ නඩු ඉදිරිපත් කළ යුත්තේ පහත සඳහන් කුමන අධිකරණයට ද?

(1) ශ්‍රේෂ්ඨාධිකරණය (2) අභියාචනාධිකරණය (3) මහාධිකරණය (4) මහේස්ත්‍රාත් අධිකරණය

31. නිදහසින් පසුව මෙරට පැවැත් වූ මහ මැතිවරණ ඉතිහාසය දෙස බලන විට එහි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ,

(1) තනි පක්ෂයක් ලෙස මැතිවරණයට ඉදිරිපත් වීම යි.

(2) පක්ෂ කිහිපයක් එක් වී පෙරමුණක් ලෙස තරග කිරීම යි.

(3) දේශපාලන පක්ෂවලින් වැඩි ගණනක් වාමාංශික පක්ෂ වීම යි.

(4) සියලුම පක්ෂ ජනවාර්ගික පදනමක් මත ගොඩනැගීම යි.

32. බ්‍රිතාන්‍ය රැජින ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායිකාව ලෙස ධූරය දැරීම අවසන් වූයේ,

(1) 1931 ඩොනමෝර් ව්‍යවස්ථාව මගිනි. (2) 1947 සෝල්බරි ව්‍යවස්ථාව මගිනි.

(3) 1972 පළමුවන ජනරජ ව්‍යවස්ථාව මගිනි. (4) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගිනි.

33. ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝග පර්යේෂණායතනය පිහිටුවා තිබෙන ප්‍රදේශය වන්නේ,

(1) මාතලේ ය. (2) අගලවත්ත ය. (3) ලුණුවිල ය. (4) තලවකැලේ ය.

34. ප්‍රංශ විප්ලවයට හේතු වූ ගැබෙල් නම් බද්ද අය කළේ කුමක් සඳහා ද?

(1) මුද්දර (2) ලුණු (3) නිවාස හා ඉඩම් (4) පාන්

35. සන්නද්ධ හටයන් යොදා ගනිමින් කළු කමිස හමුදාව පවත්වාගෙන ගිය නායකයා කවුරුන් ද?

(1) ඇඩොල්ෆ් හිට්ලර් (2) බෙනිටෝ මුසෝලිනි (3) වින්ස්ටන් චර්චිල් (4) ජෝසප් ස්ටාලින්

36. මාර්ෂල් සැලැස්මෙහි නිර්මාතෘවරුන්ගේ මූලික අරමුණ වූයේ,

(1) ලෝක සාමය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම යි.

(2) ධනවාදී බල කඳවුරු ආරක්ෂා කර ගැනීම යි.

(3) කිසිදු බල කඳවුරකට නොබැඳී කටයුතු කිරීම යි.

(4) විනාශයට පත් වූ යුරෝපයේ පරාජිත රටවල් නගා සිටුවීම යි.

37. • මහලේකම් පත් කිරීම. • අන්තර් ජාතික අධිකරණයට විනිශ්චයකරුවන් පත් කිරීම.

• නව සාමාජිකයන් සංවිධානයට බඳවා ගැනීම.

ඉහත සඳහන් කාර්යයන් අයත් වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කුමන ආයතනයට ද?

(1) ආරක්ෂක මණ්ඩලය (2) ජාත්‍යන්තර අධිකරණය

(3) මහා මණ්ඩලය (4) මහලේකම් කාර්යාලය

• පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර 28 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. සාර් පාලනය
2. රුසියානු විප්ලවය

B - 1. දෙවන ලෝක මහා සංග්‍රාමය
2. සමාජවාදී කඳවුර

C - 1. පළමුවන ලෝක සංග්‍රාමය
2. එක්සත් ජාතීන්ගේ සංවිධානය

D - 1. ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරය
2. ඔටෝවොන් බිස්මාර්ක්

38. පළමුවැන්නේ වර්ධනයට දෙවැන්නේ බලපෑම දැක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්නේ බිඳවැටීම කෙරෙහි දෙවැන්නේ බලපෑම දැක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

40. පළමුවැන්න හා දෙවැන්න අතර සබඳතාවක් නොදැක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

(ලකුණු 40 × 2 = 80)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 03 |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

උපදෙස්:

- I කොටසේ පළමුවැනි ප්‍රශ්නය අනිවාර්යය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද, පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01\. අ. (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

මීගමුව, යාපනය නගරය, කුඹුක්කන් ඔය, සීගිරිය, මහාතිත්ථ, පල්ලවවංක, පදවිය වැව, කොළඹ, ගන්නොරුව, මල්වතු ඔය, කොත්මලේ ජලාශය, ලංකාපටුන

(ලකුණු 12 යි.)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

වැනීසිය, ගෝව, මලක්කා සමුද්‍ර සන්ධිය, රතු මුහුද, පෘතුගාලය, හිරෝෂිමා (ලකුණු 06 යි.)

ආ. (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුර අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - පොළොන්නරුවේ පිහිටි දළදා මාළිගයේ ආරක්ෂාව සඳහා වේලෛක්කාර හමුදාව පත්කළ රජතුමා නම් කරන්න.

B - "ක්‍රිස්තියානින් සහ කුළුබඩු සොයා අපි මෙහි පැමිණියෙමු" යැයි ප්‍රකාශ කළ පෘතුගීසි ජාතිකයා කවුද?

C - ශ්‍රී ලංකාවේ පළමු ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයාගේ නම කුමක් ද?

D - ප්‍රංශ රාජාණ්ඩුවේ අසාධාරණකම්වල සංකේතයක් ලෙස සැලකූ බන්ධනාගාරයේ නම සඳහන් කරන්න.

(ලකුණු 04 යි.)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.


(ii) 1. A රූපයෙන් නිරූපනය වන්නේ කුමක් ද?

2\. මෙය තැනීමට භාවිත කර ඇති ද්‍රව්‍යයක් නම් කරන්න.

3\. මෙය සොයා ගන්නා ලද්දේ කුමන ස්ථානයකින් ද?

4\. මේවා භාවිත කර ඇත්තේ කවුරුන් විසින් ද?

(ලකුණු 04 යි.)




A



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(iii) 1. B රූපයෙන් නිරූපනය වන්නේ කුමක් ද?
2. එය නිර්මාණය කළේ කවුද?
3. මෙය භාවිත කළ කර්මාන්තය කුමක් ද?
4. මෙම උපකරණය මගින් ඉටුකරගත් කාර්යය කුමක් ද?
(ලකුණු 04 යි.)



B

## II කොටස

02. (i) ශ්‍රී ලංකාව පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇතුළත් දකුණු ඉන්දියානු දෙමළ සාහිත්‍ය මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) සාහිත්‍ය මූලාශ්‍රවලින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04 යි.)

(iii) චිත්‍ර, මූර්ති හා පුරාවස්තුවල ඇති වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

03. (i) ශ්‍රී ලංකාවේ පහත රට තෙත් කලාපයේ පිහිටි ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) ගල් යුගයේ මානවයින් මිනී වැළලීම සම්බන්ධයෙන් අනුගමනය කළ අභිචාර විධි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වර්ධනය හා ව්‍යාප්තිය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06 යි.)

04. (i) සෙල්ලිපිවල සඳහන් පහත නම්වලින් හඳුන්වා ඇති අය යෙදුණු කර්මාන්තය කුමක් දැයි A, B, C අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - තුලාධාර -

B - දටික -

C - කුඹකර -

(ලකුණු 03 යි.)

(ii) සොරබොර වැව ටැම් ලිපියේ සඳහන් නීති දෙකක් ලියන්න. (ලකුණු 04 යි.)

(iii) ඓතිහාසික යුගයේ දී ශ්‍රී ලංකාවේ සමාජ සංවිධානය සකස් වී පැවති ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(iv) නිරෝගී දිවි පෙවෙතක් ගත කිරීම උදෙසා පැරණි දේශීය ආහාරවල වැදගත්කම නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

05. (i) පහත ABC වලින් දැක්වෙන පැරණි තාක්ෂණය හා සම්බන්ධ නිර්මාණ මොනවා දැයි අනුපිළිවෙළින් ලියන්න.

A - ස්ථිතික ජල විද්‍යා මූලධර්මය භාවිත කොට තැනූ විශිෂ්ට නිර්මාණය -

B - මූලාශ්‍රයවල සඳහන් පරිදි රුවන්වැලි සෑය අකුණු සැරවලින් ආරක්ෂා කිරීමට යෙදූ උපකරණය -

C - වියළි කලාපීය ප්‍රදේශවල පානීය ජලයේ නියමිත ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීමට සැකසූ ළිං -

(ලකුණු 03 යි.)

(ii) ශ්‍රී ලංකාවේ පැරණි යකඩ නිස්සාරණය පිළිබඳ තොරතුරු හමු වූ ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(iii) අතීතයේ මෙරට පැවති දියුණු වෛද්‍ය සේවාව හා එහි තාක්ෂණය කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) ඉතා පුරාණ කාලයක සිට අපේ රටේ මැටි බඳුන් තැනීමේ තාක්ෂණය ඉතා දියුණු මට්ටමක පැවති බව නිදසුන් තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි.)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers Study Resources
iexamhub

06. (i) පොළොන්නරු රාජධානිය බිඳ වැටීමත් සමග ආරක්ෂිත ස්ථානවල බලකොටු පිහිටුවා ගත් ස්වදේශීය නායකයන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) පැරණි නගර පරිහානියට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04 යි.)

(iii) දෙවන නාගරීකරණ අවධියේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ ඇති වූ වෙනස්කම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස දෙවන පරාක්‍රමබාහු රජතුමාගෙන් ඉටු වූ සේවාවන් තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි.)

07. (i) ඉංග්‍රීසින් ඉන්දියාවේ වෙළෙඳ මධ්‍යස්ථාන පිහිටුවාගත් ප්‍රදේශ තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) 1818 නිදහස් සටන අසාර්ථක වීමට තුඩුදුන් හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(iii) 1848 නිදහස් සටන කෙරෙහි කෝල්බෲක් ප්‍රතිසංස්කරණ බලපෑ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) නිදහස ලැබීමෙන් පසුව මෙරට කාර්මීකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වූ ආකාරය නිදසුන් තුනක් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

## III කොටස

08. (i) පුනරුදයේ බලපෑමක් ලෙස යුරෝපය තුළ බිහි වූ ජාතික රාජ්‍යයන් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) පුනරුද සමයේ පහත සඳහන් නව සොයාගැනීම් සිදුකළ පුද්ගලයන් A, B, C, D අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - දුරදක්නය -

B - ගුරුත්වාකර්ෂණ නියමය -

C - මුද්‍රණ යන්ත්‍රය -

D - ග්‍රහලෝක සූර්යයා වටේ ඉලිප්සාකාරව ගමන් කිරීම - (ලකුණු 04 යි.)

(iii) පුනරුදය යුරෝපයේ ආර්ථික නවෝදයක් ඇති කිරීමට හේතු වූ බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) පුනරුදය ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික වෙනස්වීම් කෙරෙහි බලපෑ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

09. (i) පළමුවන ලෝක මහා සංග්‍රමයේ දී

(a) මධ්‍ය බලවතුන්ගේ පිළට අයත් වූ රටවල් එකක් ද,

(b) මිත්‍ර බලවතුන්ගේ පිළට අයත් වූ රටවල් දෙකක් ද, පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) පළමුවන ලෝක මහා සංග්‍රාමයට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04 යි.)

(iii) දෙවන ලෝක මහා සංග්‍රාමය සඳහා හිට්ලර්ගේ ක්‍රියා කලාපය බලපෑ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iv) දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵල ලෙස ලෝකයේ ඇති වු දේශපාලනික වෙනස්වීම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

******



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province


Learning Resource Center
R
De Mazenod College
Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය வரலாறு History | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: |


නම / பெயர் / Name ......................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................................

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)






www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub






www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources